# ලිලීයි පිංකියි හොඳ යාළුවෝ වුණා



මෙතුලි නෙත්මා ජයවීර

# ලිලීයි පිංකියි හොඳ යාලුවෝ වුණා.

කතාව සහ චිත්‍ර

මෙතුලි නෙත්මා ජයවීර

**ISBN 978-624-206-897-8**

පළමු පිටපත සහ මුද්‍රණය

**2023 නොවැම්බර් 15**

# පිදුම

මගේ ආදරණීය අම්මාටත්, අප්පච්චීටත්,

මා හට නිති ඔවදන් දෙන

ආදරණීය අත්තාටත්, අත්තම්මාටත්,

මගේ ආදරණීය අයියා මෙතුකටත්,

හරි මඟ යාමට මට ගුරුහරුකම් දෙන ආදරණීය

සමන්මලී ගුරු මෑණියන්ටත්

ඉතා සෙනහසින් පුදමි.

# ස්තුතිය

*මා හට මේ*

*පොත නිම කිරීමට*

*නන් අයුරින්*

*සහයෝගය දුන්*

*සියලුම දෙනාට*

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කල "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්ව පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

එකමත් එක රටක පුංචි ගම්මානයක පිංකි කියලා ළමයෙක් හිටියා.



එයා හරිම ලස්සනයි.

ඒ වගේම කරුණාවන්තයි.

පිංකි ඉගෙන ගන්නත් දක්ෂයි.

නටන්න, ගයන්න, චිත්‍ර අඳින්න පිංකි තරම් දක්ෂ කෙනෙක් මුළු ඉස්කෝලෙටම හිටියේ නෑ.

පාසලේ ගුරුවරු සහ ළමයි පිංකිට හරිම ආදරෙයි.

පිංකි හැමදාම පන්තියේ පළවෙනියා. හැබැයි එයා කවදාවත් ආඩම්බර වුණේ නෑ.

අනිත් ළමයින්ට ඕනෙම වෙලාවක පිංකි උදව් කරා.



පිංකිගේ පන්තියේ ම හිටියා තවත්
ළමයෙක් ලිලී කියලා එයත් දක්ෂයි.
හැබැයි ලිලීට පිංකි නිසා පන්තියේ
පළමුවෙනියා වෙන්න කවදාවත් ම
බැරි උනා.

ඒ නිසා ලිලී
පිංකි එක්ක
අමනාපයෙන් හිටියේ.

පිංකිට හැමෝම ආදරේ කරපු නිසා
ලිලී පිංකිට කැමති උනේ නෑ.

පිංකි පාසලේ බැබළෙන දරුවෙක් වීම
ගැන ලිලී හිටියේ තරහෙන්.

එයා කල්පනා කරා පිංකිට හොඳ
වැඩක් කරන්න ඕනෑ කියලා.

දවසක් විවේක කාලයේ දී ළමයි
හැමදෙනාම සෙල්ලම් කරමින් හිටියා.

පිංකි තනියම බංකුවට වෙලා
වාඩිවෙලා ඉන්නවා ලිලී දැක්කා.

ලිලී පිංකි ළඟට ඇවිත් වාඩි වුණා.
ලිලී පිංකිගෙන් මෙහෙම ඇහුවා.
“මේ මං ඔයාට රහසක් කියන්න ද?”

පිංකි ඇහුවා ඒ මොකද්ද කියලා

“පිංකි අපේ ගෙදර ළඟ ලොකු කැලෑවක් තියනවා.”

“ඒ කැලෑවේ රත්තරන් මුවෙක් ඉන්නවා. මම දවස් ගානක්ම දැක්කා. අපි යමුද ඒ මුවා බලන්න.”

ලිලී රත්තරන් මුවා ගැන, කැලෑව ගැන කියපු විස්තර අහලා පිංකිටත් ආස හිතුනා කැලේට ගිහින් මුවා බලන්න. ඉස්කෝලේ ඇරිලා ගෙදර යන ගමන් ලිලීත් එක්ක කැලේ බලන්න යන්න කතා කරගත්තා.



කැලේ ඇතුලට ටික දුරක් යද්දී පිංකි ලිලීගෙන් ඇහුවා

"කෝ අර මුවා?"

ලිලී කිව්වා

"තව ටික දුරක් යමු පිංකි" කියලා.

කැලේ හරි ලස්සනයි.

පාට පාට මල් පිරිලා කුරුල්ලෝ සිංදු කියනවා.

සමනලයෝ පියාඹනවා.

පිංකිට කාලය ගතවෙනවා දැනුනේ නෑ.

එක පාරටම පිංකිට දැනුණා ලිලී නෑ කියලා.

"ලිලී ......... ලිලී ........."

පිංකි හයියෙන් කෑ ගැහුවා. ලිලී පේන්න හිටියේ නෑ.

කරුවල වැටීගෙන එනවා ඒ නිසා පිංකිට බය හිතුනා.


පිංකි අඬන්න ගත්තා.

කැලේ මැද්දින් යන දඩයක්කාරයෙකුට පිංකි අඬන සද්දේ ඇහුණා.

දඩයක්කාරයා දුවගෙන ආවා.

"මොකද මේ ළමයා තනියෙන් කැලේ මැද්දේ කරන්නේ ? " කියලා දඩයක්කාරයා ඇහුවා.

පිංකි දඩයක්කාරයාට අඬමින්
විස්තරේ කිව්වා.




දඩයක්කාරයා පිංකිට ගෙදරට යන
පාර පෙන්නන්න පොරොන්දු වුණා.

පිංකි දඩයක්කාරයා එක්ක ගෙදර යද්දී දැක්කා පිංකිගේ ගෙදර අයයි, ලිලීයි පිංකිව හොයාගෙන එනවා.

පිංකි දැක්ක ගමන් ලිලී දුවගෙන ළඟට ආවා.

“මට සමාවෙන්න පිංකි. මම ඔයා කැලේ අතරමං කරලා ගෙදර ආවා. කරපු වැරැද්ද තේරුණ නිසා මම ඔයාගේ ගෙදර අයට කියලා එයාලා එක්ක ඔයාව හොයන්න ආවා.”



“මට සමාවෙන්න. ආයෙත් මම
කවදාවත් ඔයාට වරදක්
කරන්නේ නෑ පිංකි.”
ලිලී අඬමින් කිව්වා.

පිංකි ලිලීට සමාව දුන්නා.

එදා ඉඳන් ඒ දෙන්නා
හොඳ යාලුවෝ වුණා.

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කරුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,

සෙනවිරත්න මහලේකම්,

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01